# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2084/2 – 2018 අගෝස්තු මස 13 වැනි සඳුදා – 2018.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2017 අංක 05 දරන මධ්‍යම පළාත් සභාවේ වාරිමාර්ග ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, හින්දු සංස්කෘතික, ද්‍රවිඩ අධ්‍යාපන හා වතු යටිතල පහසුකම් යන විෂයයන් භාර අමාත්‍ය එම්. රාමේෂ්වරන් යන මම, මෙහි පළ කරන ලද මධ්‍යම පළාතේ වාරිමාර්ග ප්‍රඥප්ති කෙටුම්පත මෙම *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත්වීමෙන් පසු මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

**එම්. රාමේෂ්වරන්,**
මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා
සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, හින්දු සංස්කෘතික,
ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) හා වතු යටිතල පහසුකම් අමාත්‍ය.

2018 අගෝස්තු මස 03 වැනි දින,
ගැටඹේ.
මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී ය.


1A – G28263 – 17 (2018/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

''මධ්‍යම පළාත් සභාවේ 2017 අංක 5 දරන වාරිමාර්ග ප්‍රඥප්ති කෙටුම්පත''

මධ්‍යම පළාත් ගොවි ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා කෘෂිකාර්මික හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නගා සිටුවීම සඳහා පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලායන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර මධ්‍යම පළාතේ සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම සහ සුළු වාරිමාර්ග වැඩ කටයුතු පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම සඳහා ද මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා ද වාරි කළමණාකරණ හා සංවර්ධන කමිටු සහ වාරි කළමණාකරණ ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම හා ඒවායේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ වූ හා ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-*

ලුහුඬු නාමය සහ බලාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 2017 අංක 5 දරන මධ්‍යම පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට බලාත්මක වන්නේ ය.

i වන කොටස

**මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම**

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතුය.

මධ්‍යම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ.

3. (i) දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් හා බලතල ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා (මෙහි මින්මතු පළාත් අධ්‍යක්ෂ යනුවෙන් හඳුන්වනු ලබන) මධ්‍යම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ පත් කළ යුතු වන්නේ ය. එම තැනැත්තා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධානවලට හා ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතුය.

(ii) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 වන පංතියේ නිළධාරියෙකු පළාත් අධ්‍යක්ෂවරයා ලෙස පත්කළ යුතුය.

(iii) පළාත් අධ්‍යක්ෂ, පළාත් වාරිමාර්ග විෂය භාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතුය.

දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිළධාරීන් පත් කිරීම.

4. මෙම ප්‍රඥප්තියේ බලතල කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පළාත් අධ්‍යක්ෂකට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි වාරිමාර්ග ඉංජිනේරුවරුන් හා කාර්යය මණ්ඩලය 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන වලට අනුකූලව පත්කළ යුතු වන්නේ ය.

බලතල පවරාදීම.

5. පළාත් අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍යයන් හා බලතල ඉහත 4 වැනි වගන්තිය යටතේ පත් කරනු ලබන නිළධාරීන් වෙත පවරා දිය හැකිය.

දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම.

6. මධ්‍යම පළාත් විෂයභාර අමාත්‍යවරයා විසින් මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් කාර්යාල පිහිටු විය හැකි අතර, අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශීය කාර්යාල පිහිටුවනු ලැබිය හැක.

ii වන කොටස

**දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය හා බලතල**

දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය හා බලතල.

7. දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් හා බලතල පහත සඳහන් පරිදි විය යුතුය.

(i) පළාතේ වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදන, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම.

(ii) සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම.

(iii) ඉහත (i), (ii) යටතේ ඇති වාරි කර්මාන්ත තුළ හෝ ඊට ප්‍රවේශ ලබන්නා වූ මාර්ග පද්ධති සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම.

(iv) මෙම ප්‍රඥප්තියෙන් ක්‍රියාත්මක කිරීමට නියමකර ඇති කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම.

(v) පළාත් අධ්‍යක්ෂවරයා විසින් මධ්‍යම පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්වන සියළුම වාරි ක්‍රමවල ලැයිස්තුවක් සකස්කර රජයේ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කිරීම.

(vi) අවස්ථානුකූලව මෙම ලැයිස්තුව සංශෝධනය කළ හැකිය.

(vii) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු මෙන්ම වාරි කළමණාකරණ ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම.

(viii) ඉහත v යටතේ *ගැසට්* කරනු ලබන වාරි ක්‍රමවල පළාත් අධ්‍යක්ෂගේ අනුමැතියකින් තොරව වෙනත් ආයතනවලින් ඉදිකිරීම් හෝ නඩත්තු කටයුතු ඉටු නොවන බවට වගබලා ගැනීම සහ අනුමැතිය ලබාදෙන ව්‍යාපෘති සම්බන්ධව සැලසුම් හා තොරතුරු ලේඛනගත කිරීම.

(ix) වාරි රක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම, සීමා නිර්ණය කිරීම, සංරක්ෂණය හා ආරක්ෂා කිරීම හා වාරිමාර්ග පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.

(x) වාරි පද්ධතිවලට හා එහි නිර්මිතවලට හානි පමුණුවන, අල්ලාගනු ලබන සහ වාරි කර්මාන්තයක රැස්කොට තබා ඇති ජලය කවර හෝ ආකාරයකට ඕනෑකමෙන් හෝ ද්වේශ සහගත ලෙස හෝ අපතේ යාමට සලසනු ලබන පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම.

(xi) යම් වාරි කර්මාන්තයකදී යම් වාණිජ ක්‍රියාකාරකමක නියැලීම හෝ කර්මාන්තයක නියැලීම හෝ එවැනි වාරි කර්මාන්තයක් අනවසර ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගන්නා පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම.

(xii) වාරි පද්ධතිවලට හා කෘෂි ඉඩම්වලට සිදුවන ගංවතුර හා නාය යෑම් වැනි පාරිසරික හානි පාලනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රම සම්පාදනය කිරීම.

(xiii) වාරි කර්මාන්ත වලින් සැපයෙන ජලය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම.

(xiv) වාරි කර්මාන්ත ඉදිකිරීම, නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම හා ජල කළමණාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම මගින් ධාරිතා සංවර්ධනය කිරීම.

(xv) වාරි කර්මාන්තවලට අදළ වැඩසටහන් ක්‍රියාත්මක කරන අවස්ථාවලදී ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අදළ ආයතන හා බලධාරීන් සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑම.

(xvi) වගා කළ යම් ප්‍රදේශයක ජලය බැස යාමට සැලැස්වීම හෝ ඒ ප්‍රදේශයට ජලය ගලා ඒම හෝ ඉන් පිටතට ගලා යාම වැළැක්වීම විධිමත් කිරීම හෝ එවැනි ප්‍රදේශ ජලගැලීම් වලින් ආරක්ෂා කිරීම සඳහා ඉදි කරන ලද යම් ඉංජිනේරු කර්මාන්තයක් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදි කිරීම, නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම.

(xvii) වාරි කර්මාන්ත නඩත්තු කිරීම සහ ඉදිකිරීම්වලදී වෙනත් යම් රජයේ හෝ රාජ්‍ය නොවන හෝ ස්වේච්ඡා සංවිධානවල සහභාගීත්වය ලබා ගැනීම.

(xviii) පළාත් අධ්‍යක්ෂවරයා සහ/හෝ පළාත් අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පරිශ්‍රයකට අවශ්‍යතාවය මත කවර වේලාවක හෝ ඇතුළු වීම හා පරීක්ෂා කිරීමට හැකිවීම.

(xix) අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණය යටතට ගැනෙන විෂයන්වලට අදාල ඉංජිනේරුමය උපදේශනය ලබා දීම.

(xx) දෙපාර්තමේන්තුවේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ අනෙකුත් කළමනාකරණ හා පරිපාලන බලතල.

iii වන කොටස

**වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවීම.**

වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවීම.

08. 1. පළාත් අධ්‍යක්ෂගේ මග පෙන්වීම මත සෑම වැවක්, අමුණක්, එල්ලාංග පද්ධතියක් හෝ වාරි පද්ධතියක් හෝ වාරි යෝජනා ක්‍රමයක් සඳහාම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් (මින් මතු වාරි කමිටුව නමින් හඳුන්වනු ලබන) පිහිටුවිය හැක්කේ ය.

ලියාපදිංචිය.

2. කුමන මට්ටමක හෝ වාරි කමිටුවක් පළාත් අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතුය.

බලතල හා වගකීම්.

3. කුමන මට්ටමක හෝ වාරි කමිටුවක් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය.

4. මෙකී කමිටුවලට පැවරී ඇති සියලු කටයුතු ඉටුකිරීමටද එවැනි කටයුතුවලදී නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේ ය.

5. අදල වාරිමාර්ග බල ප්‍රදේශයක් තුළ කුඹුරු ඉඩම් වගාකරනු ලබන භුක්තිකරුවන්නේ හා ඉඩම් හිමියන්ගේ රැස්වීමක් පවත්වා ඒ ඒ කන්නවලදී ගනු ලබන වගා කිරීමට අදල තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට, ඊට අදල විධිවිධාන සැලැස්වීමට අවශ්‍ය කටයුතු කිරීමට හැකි වන්නේ ය.

6. අදල රීති පැනවීමට විෂය භාර අමාත්‍යවරයාට හැකිවන්නේ ය.

කමිටු සාමාජිකත්වය හා ආශ්‍රිත සාමාජිකත්වය.

09. කමිටු සාමාජිකත්වය:

1. කෘෂිකර්මාන්තයට තම ජීවිකාව කරගත් සෑම තැනැත්තෙකුටම තමා:–

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්,

(ii) වයස අවුරුදු දහඅටට නොඅඩු නම් හා,

(iii) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන වාරි කමිටු බල ප්‍රදේශයේ ස්ථිරව පදිංචි වී ඇත්තේ නම් හෝ අවුරුදු දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා ඒ බල ප්‍රදේශයේ වාරි ජලය ලබාගෙන කෘෂිකාර්මික කටයුතුවල නිරත වී සිටී නම්,

(iv) ප්‍රතිලාභ ලබන ඉඩම් හිමි ගොවියෙකු හෝ ජලය ලබාගෙන වගා කටුයතුවල නිරත වන ඉඩම් හිමි ගොවියෙකු හෝ භුක්තිකරුවෙකු නම්,

ඉහත 08 වන වගන්තිය යටතේ පිහිටු වන ලද වාරිකමිටුවක සාමාජිකත්වය ලබා ගත හැක්කේ ය.

2. කමිටුවේ ආශ්‍රිත සාමාජිකත්වය:

(i) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදල නිලධාරීන්, සංවිධාන හෝ ආයතන,

(ii) පළාත් අධ්‍යක්ෂ විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අදල නියෝජිත ආයතනවලින් නියෝජිතයෙක්,

ඉහත කමිටුවේ ආශ්‍රිත සාමාජිකත්වය දැරිය හැක්කේ ය.

10. (i) ඉහත වාරි කමිටුවේ නිලධාරීන් පත්කරගැනීම සඳහා මහා සභාවක් කැඳවිය යුතු අතර, එහි මූලාසනය පළාත් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් දැරිය යුතුය. එහිදී කමිටුවේ සාමාජිකයන් අතුරින් සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන නිලධාරීන් තිදෙනෙකුද, උප සභාපති, උප ලේකම් සහ කාරක සභිකයින් දෙදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් පත්කර ගත යුතුය. නිලධාරීන් හා ව්‍යවස්ථාව.

(ii) සෑම වාරි කමිටුවක් සඳහා කමිටුවේ සංයුතිය, අරමුදල, කමිටුව පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන ඇතුලත් ව්‍යවස්ථාවක් තිබිය යුතුය. පළාත් අධ්‍යක්ෂකගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාවට අඩංගු විය යුතු පොදු විධිවිධාන, අමාත්‍යාංශ ලේකම් විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකිය. මේ සඳහා අවශ්‍ය රීති අමාත්‍යවරයා විසින් සකස්කොට ප්‍රකාශයට පත් කළ යුතුය.

(iii) වාරි කමිටුවේ නිල කාලය පළමුවරට පත්වන දින සිට වසර 02 ක කාලයක් වලංගු වේ. එසේ වුවද වසර දෙක අවසන් වීමට පෙර දින 14 ක කාලයක් ඇතුළත මහා සභාවක් රැස්කර නව නිලධාරි මණ්ඩලයක් පත්කරගත යුතුවේ. ප්‍රධාන තනතුරක් සඳහා අඛණ්ඩව දෙවතාවකට වඩා පත්විය නොහැක. නව නිලධාරීන් පත්වූ දිනයේදී එතෙක් සිටි නිලධාරීන්ගේ නිල කාලයඅවසන් වූවා සේ සැලකේ. නිල කාලය.

(iv) කිසියම් කමිටුවක් මූල්‍ය අවභාවිතයක් හෝ මූල්‍ය වංචාවක් සිදුකළ බවට සිදුකරන ලද පරීක්ෂණයකින් හෙළිවූ කරුණු පදනම්කරගෙන එකී චෝදනාවට වරදකරුවෙකු වන කිසියම් තැනැත්තෙකු පළාත් අධ්‍යක්ෂවරයා විසින් නිලයෙන් ඉවත් කළ හැකිය. එසේ ඉවත් කරන වරදකරුවෙකුට වසර 05 ක් ගතවන තුරු නැවත තනතුරකට පත්විය නොහැක.

(v) ඉහත (10 iv) සඳහා අභියාචනයක් දින 14 ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම්වරයාට ඉදිරිපත් කළ හැකිය. ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

11. (i) ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට යටත්ව සෑම වාරි කමිටුවකටම අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එකී අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතුය. කමිටු අරමුදල.

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇති රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කරනු ලබන ආකාරයට මෙම ගිණුම් විගණනයට යටත් විය යුත්තේ ය. විගණනය.

(iii) පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන සීමාවන් යටතේ ඕනෑම මට්ටමක වාරි කමිටුවකට ගිවිසුම් වලට එළඹීමේ බලය ඇත්තේ ය. ගිවිසුම්වලට එළඹීම.

(iv) කුමන මට්ටමක හෝ වාරි කමිටුවක්, අමාත්‍යාංශ ලේකම්වරයාගේ හෝ පළාත් අධ්‍යක්ෂවරයාගේ සහ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ පළාත් අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත් වන්නේ ය.

12. සෑම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් ම තම බල ප්‍රදේශය තුළ:– කමිටු කාර්යභාරය.

(i) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉටු කල යුතු වැඩ අයිතමයන් නිසියාකාරව ඉටුවන්නේ ද යන්න පිළිබඳ සොයා බලා දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන්ට වාර්තා කළ යුත්තේ ය.

(ii) සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට ලබාගත යුතු ගොවි දයකත්වය ලබාගත යුත්තේ ය.

(iii) සංවර්ධන ව්‍යාපෘතියේ නඩත්තු කාලසීමාව තුළ සහ ඉන් අනතුරුව වඩාත් ඵලදයි ලෙස වාරි කර්මාන්තය පවත්වාගෙන යාමට කටයුතු කළ යුත්තේ ය.

(iv) කෘෂිකාර්මික ඉඩම්වල හෝ කුඹුරු ඉඩම්වල වී වගා කිරීම හෝ වෙනත් ආකාරයක බෝග වගා කිරීම සඳහා ධෛර්යය දීම හා එම වගා කටයුතු ව්‍යාප්ත කිරීම කළ යුත්තේ ය.

(v) වගා කිරීමට හෝ වෙනත් ආකාරයේ වගා කිරීම්වලට අදළ චාරිත්‍ර වාරිත්‍ර හා සම්මුතීන් සිදුකිරීම ක්‍රියාත්මක කල යුත්තේ ය.

(vi) භුක්තිකරුවන් හා ඉඩම් හිමි ගොවීන්ගේ රැස්වීම්වල දී ගන්නා තීරණවලට අනුකූලව කෘෂිකාර්මික කටයුතු නිසි කලට වේලාවට කරනු ලබන බවට වග බලා ගත යුත්තේ ය.

(vii) වාරි කර්මාන්ත වලින් සැපයෙන ජලය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා ජලය, කාර්යක්ෂම ලෙස කළමනාකරණ කළ යුත්තේ ය.

(viii) පස සංරක්ෂණය කිරීම සඳහා පස පලිබෝධවලින් හා රෝග වලින් භෝග ආරක්ෂා කිරීම සඳහා පියවර ගත යුත්තේ ය.

(ix) සෑම වාරි කමිටුවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය තුළ පිහිටි යම් කුඹුරු ඉඩමකට යාබදව හා ඇළ මාර්ගයකට යාබදව පිහිටි ගොඩ ඉඩම්වල ගස්වල අතු හා අකුල් කපා ඉවත් කිරීමට සහ යම් කුඹුරු ඉඩමක හෝ ගොඩ ඉඩමක හෝ වගා කොට ඇති භෝග වලට බාධාවක්ව පිහිටා ඇති ලඳු කැළෑ කපා ඉවත් කිරීම නියම කිරීමට පියවර ගත යුත්තේ ය.

(x) ඉඩම්වල සහ යම් වාරිමාර්ග ක්‍රමයක් තුළ පිහිටි කෘෂිකාර්මික ඉඩම්වල සාමූහික කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමට අදල රීති සෑදීමේ කාර්යය සඳහා ඉඩම් හිමි ගොවින්ගේ හා භුක්තිකරුවන්ගේ " රැස්වීම් කැඳවිය යුත්තේ ය.

(xi) වාරි කර්මාන්තවලට සිදුවන හෝ සිදුකරනු ලබන බාධා හෝ අලාභ හානි සහ ගංවතුර හෝ වෙනත් ආපදා අවස්ථාවලදී ඒ පිළිබඳව අදළ නිලධාරීන් වහාම දැනුවත් කළ යුත්තේ ය.

13. වාරි නියෝජිතයා පත් කිරීම.

වාරි නියෝජිතයා පත් කර ගැනීම.

1. වාරි කමිටුව පත්කර ගන්නා අවස්ථාවේදී සාමාජිකයින්ගේ වැඩි කැමැත්තෙන් වාරි නියෝජිතයා නමින් පුද්ගලයෙකු තෝරා පත් කරගත යුතුය. වාරි නියෝජිතයා මතුවට, සාදනු ලබන නියෝගවල සඳහන් වාරි කමිටුවේ සභාපති, ලේකම් හෝ කාරක සභාවෙහි නිලධාරීන් අතුරෙන් අයෙක් වුවද විය හැකිය.

කමිටුවෙන් ඉල්ලා අස්වීම.

2. (i) පළාත් අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් ඉදිරිපත් කිරීමෙන් හෝ,

(ii) අකාර්යක්ෂමතාවය හෝ අකටයුතුකම් පදනම් කරගෙන පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් කරන ලද පරීක්ෂණයකින් හෙළි වූ කරුණු පදනම් කරගෙන හෝ ඉවත් කළහොත් විනා,

(iii) අන් සෑම අවස්ථාවකදීම තමන් තෝරා පත් කර ගත් දිනයේ සිට වසර දෙකක් හෝ ව්‍යවස්ථාවේ සඳහන් කාලයක් සඳහා වාරි නියෝජිතයා රාජකාරියේ නිරතවන්නේ ය.

වාරි නියෝජිතයාගේ කාර්යභාරය.

3. වාරි නියෝජිතයාගේ කාර්යභාරය:–

කුඹුරු නාම ලේඛනය සකස් කළ යුතු බව.

(i) කමිටුවේ සෙසු නිලධාරින්ගේ සහයෙන් යායේ කුඹුරු නාම ලේඛනයක් සකස් කළ යුතුය.

(ii) මෙම නාම ලේඛනයෙහි එක් එක් ඉඩම් හිමි ගොවියාට හෝ භුක්තිකරුට හිමිවන කුඹුරු ඉඩම්වලට වපසරියට අනුපාතිකව ඔවුන් වෙත ප්‍රධාන වාරි වේල්ල හා ප්‍රධාන බෙදුම් ඇළ, වැව් බැම්ම, වාන් ඇළ යනාදිය ශුද්ධ කිරීම සඳහා බෙදා වෙන්කොට භාරදීම කළ යුතුය. මෙම පංගු ලේඛනයේ භුක්ති කරුවෙකු වගා කරන ඉඩමෙහි ඉඩම් හිමියා කවුරුන් ද යන්න ද ලේඛනයේ සඳහන් විය යුතුය.

පංගුව සලකුණු කිරීම.

(iii) එක් එක් ඉඩම් හිමිකරු හෝ භුක්තිකරුට බෙදා භාර දුන් කොටස ඔවුන් විසින් භූමියෙහි කාලයක් පවතින අරටු සහිත ලී හෝ සිමෙන්තියෙන් හෝ ගලින් හෝ සාදන ලද මායිම් සලකුණු කළ හැකි ක්‍රමයකින් සපයන ලද ද්‍රව්‍ය යොදගෙන පොළොවෙහි මතුපිට කොටසක් පෙනෙන සේ වළලා සළකුණු කළ යුතුය.

(iv) මෙසේ සලකුණු කොට වෙන්කරනු ලබන කොටස, සෑම කන්නයක් ආරම්භ වීමට ප්‍රථමයෙන් වැඩී ඇති කටු පඳුරු සහිත කැලය ඉවත්කොට පස සේදී යාම නිසා හානි සිදුවී ඇති බැම්මේ කොටසේ, වෙන්කොට ඇති රක්ෂිතයෙන් හෝ වාරි ක්‍රමය ඇතුළින් හෝ පස් කපා පුරවා මනා සේ සකස් කළ යුතු අතර තම පංගුව තුළ වැඩෙන හුඹස් කපා ඉවත් කිරීම ද කළ යුතුය. මීට අමතරව වාරි කමිටුව විසින් කන්න අතරතුරදී කිසියම් වාරි කර්මාන්තයක නඩත්තු කටයුතු කළයුතු යයි තීරණය කරන අවස්ථාවක දී එම තීරණය පංගු කරුවන් වෙත දන්වා නඩත්තු කටයුතු ඉටු කරවා ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

v. 13-3 (iii) උප වගන්තියේ බෙදා වෙන්කර දෙන ලද තම පංගුව මනා සේ පවත්වාගෙන නොයන ඉඩම් හිමියෙකුගේ හෝ පංගු කරුවකුගේ හෝ කොටස වාරි කමිටුව විසින් ශුද්ධ කරවා ඒ සඳහා වැය වූ මුදල ගෙවන ලෙස පැහැර හැරීම කළ තැනැත්තාට වාරි කමිටුව විසින් දැනුම් දිය යුතුය.

(i) එම දැන්වීම ලැබී දින 21 ක් ඇතුළත ගෙවීම පැහැර හැරිය හොත් පැහැර හැරීම සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(ii) ඉහත i යටතේ වරදක් සිදුකරනු ලැබූවිට වාරි කමිටුව විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමකින් එම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ අයකරනු ලබන මුදල දඩ මුදලක් වශයෙන් අයකර කමිටු අරමුදලට බැරකළ යුතුය.

(vi) වාරිමාර්ග ආරක්ෂා කිරීම, වාරිමාර්ග ක්‍රමවලට හානි පමුණුවන්නන් පිළිබඳව පළාත් අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කිරීම, නීතිය ඉදිරියට ගෙන යාමට සහය වීම, වාරි ජලාශවල සහ වාරි ක්‍රමවලින් නිකුත් කෙරෙන ජලය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, වගා සැලසුම් කාල සටහන්වලට අනුව වගා සටහන් පවත්වාගෙන යාම සහ මෙහෙයවීම කළ යුත්තේ ය.

14. ඉහත සඳහන් කරුණු ඉටුකිරීම වෙනුවෙන් සෑම ඉඩම් හිමි ගොවියකුම හෝ භුක්තිකරුවකු හෝ අඳ කරුවකුම හෝ වාරි නියෝජිතයා වෙත තමා ලබාගන්නා අස්වැන්නෙන් හෝ මහ සභාවෙන් නියම කරනු ලබන මුදලක් හෝ පාරිශ්‍රමිකයක් වශයෙන් ලබා දිය යුත්තේ ය. එම පාරිශ්‍රමිකය ගෙවීම පැහැර හැරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය. පාරිශ්‍රමිකය.

iv වන කොටස

**වාරි කළමනාකරණ ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටුවීම**

15. වාරි කළමනාකරණ ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටුවීම

1. (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පිහිටි සියළුම වාරි කළමනාකරණ සහ සංවර්ධන කමිටුවල ඒකාබද්ධතාවයෙන් මධ්‍යම පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම වාරි කළමනාකරණ ප්‍රාදේශීය බලමණ්ඩලයක් පැවතිය හැක්කේ ය. (මින් මතු ප්‍රාදේශීය බල මණ්ඩලය නමින් හඳුන්වනු ලබන.) එකී ප්‍රාදේශීය බලමණ්ඩලය එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පිහිටි ලියාපදිංචි වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවලින් තෝරාගන්නා ලද සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය. වාරි කළමනාකරණ ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම.

(ii) ප්‍රාදේශීය බලමණ්ඩලයේ නිලධාරීන් පත්කරගැනීම සඳහා මහා සභාවක් කැඳවිය යුතු අතර එහි මූලාසනය පළාත් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් දැරිය යුතුය. එහිදී කමිටුවේ සාමාජිකයන් අතුරින් සභාපතිල ලේකම් හා භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන නිලධාරීන් තිදෙනෙකුද උප සභාපති, උප ලේකම් සහ කාරක සභිකයින් හතරදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් ද පත්කර ගතයුතු ය.

(iii) සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින්ම එහි සංයුතිය, අරමුදල, බල මණ්ඩලය පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන ඇතුළත් ව්‍යවස්ථාවක් තිබිය යුතුය. පළාත් අධ්‍යක්ෂකගේ නිර්දේශය මත එම ව්‍යවස්ථාවට අඩංගු විය යුතු පොදු විධිවිධාන අමාත්‍යාංශ ලේකම් විසින් කළින් කලට නියම කරනු ලැබිය හැකිය. මේ සඳහා අවශ්‍ය රීති අමාත්‍යවරයා විසින් සකස්කොට ප්‍රකාශයට පත්කළ යුතුය.

(iv) ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිල කාලය පළමුවරට පත්වන දින සිට වසර 02 ක කාලයක් වලංගු වේ. එසේ වුවද වසර දෙක අවසන් වීමට පෙර දින 14 ක කාලයක් ඇතුළත මහා සභාවක් රැස්කර නව නිලධාරි මණ්ඩලය පත්කරගත යුතුවේ. ප්‍රධාන තනතුරක් සඳහා අඛණ්ඩව දෙවතාවකට වඩා පත්විය නොහැක. නව නිලධාරින් පත්වූ දිනයේදී එතෙක් සිටි නිලධාරින්ගේ නිල කාලය අවසන් වූවා සේ සැලකේ. නිල කාලය.

(v) කිසියම් ප්‍රාදේශීය බල මණ්ඩලයක මූල්‍ය අවභාවිතයක් හෝ මූල්‍ය වංචාවක් සිදුකළ බවට සිදුකරන ලද පරීක්ෂණයකින් හෙළිවූ කරුණු පදනම්කරගෙන එකී චෝදනාවට වරදකරුවෙකු වන කිසියම් තැනැත්තකු පළාත් අධ්‍යක්ෂවරයා විසින් නිලයෙන් ඉවත් තළ හැකිය. එසේ ඉවත්කරන වරදකරුවෙකුට වසර 05 ක් ගතවනතුරු නැවත තනතුරකට පත්විය නොහැක.

(vi) ඉහත (15v) සඳහා අභියාචනයක් දින 14 ක් තුළ අමාත්‍යාංශ ලේකම්වරයාට ඉදිරිපත් කළ හැකිය. ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

2. ඉහත (15-1) යටතේ පත්කරනු ලබන සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයක්ම පළාත් අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතුය.

3. එම ප්‍රාදේශීය බලමණ්ඩලයකටම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය.

4. මෙකී ප්‍රාදේශීය බලමණ්ඩලයට පැවරී ඇති සියලු කටයුතු ඉටුකිරීමටද, එවැනි කටයුතුවලදී නඩුපැවරීමට හා නඩු පවරනු ලැබීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේය.

බලතල හා වගකීම්.

16. වාරි කළමනාකරණ ප්‍රාදේශීය බලමණ්ඩලයක් තම බල ප්‍රදේශය තුළ;

(i) පත්කර ගන්නා ලද ප්‍රධාන නිලධාරීන් තිදෙනා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව නියෝජනය කළ යුත්තේය.

(ii) වාරි කළමනාකරණ සහ සංවර්ධන කමිටු අතර අන්තර් සම්බන්ධතාවය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුත්තේය.

(iii) වාරිමාර්ග වැඩ සංරක්ෂණය කළ යුත්තේය.

(iv) වාරි ක්‍රමවල පුනරුත්ථාපනය සහ සංවර්ධන කටයුතු වලදී ප්‍රමුඛත්වයන් තීරණය කළ යුත්තේය.

(v) අදාල වාරි රක්ෂිත ආරක්ෂා කර ගැනීම හා ධාරා ප්‍රදේශ සංවර්ධනය හා සංරක්ෂණය කළ යුත්තේය.

(vi) සියළු වාරි ක්‍රම ආශ්‍රිත උස්බිම් සංවර්ධනය කිරීමට සහය විය යුත්තේය

(vii) රීති හා නියෝග මගින් පනවනු ලබන වාරි ක්‍රමවල තිබිය යුතු අංගෝපාංග වෙන්කොට තබාගැනීමට සහ ආරක්ෂා කිරීමට සහය විය යුත්තේය.

අරමුදල.

17. (i) ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට යටත්ව සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයකටම අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එකී අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතුය.

විගණනය.

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇති රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කරනු ලබන ආකාරයට මෙම ගිණුම් විගණනයට යටත්විය යුත්තේය.

ගිවිසුම්වලට එළඹීම.

(iii) පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන සීමාවන් යටතේ ඕනෑම ප්‍රාදේශීය බල මණ්ඩලයකටම ගිවිසුම්වලට එළඹීමේ බලය ඇත්තේය.

(iv) සෑම ප්‍රාදේශීය බල මණ්ඩලයක්ම විෂයය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ හෝ පළාත් අධ්‍යක්ෂවරයාගේ සහ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ පළාත් අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත් වන්නේය.

18. ඉහත 8 හා 15 වගන්ති යටතේ ස්ථාපනය කරනු ලබන වාරි කමිටු හා ප්‍රාදේශීය බල මණ්ඩල සම්බන්ධ අනෙකුත් කරුණු හා පරිපාටි සම්බන්ධයෙන් විෂයය භාර අමාත්‍යවරයා විසින් රෙගුලාසි නියම කරනු ලැබිය හැක්කේය. රෙගුලාසි සෑදීමේ බලය.

V වන කොටස

**වැරදි සහ දඬුවම්**

19. පළාත් අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතියකින් තොරව:-

1. යම් තැනැත්තෙක් යම් වාරි කර්මාන්තයකට, ජලමාර්ගයකට, ඉවුරකට, වැවකට, වේල්ලකට, වැවක හෝ අමුණක හෝ වාරි කර්මාන්තයක ප්‍රවේශයකට, වාරි කර්මාන්තයක රක්ෂිතයකට, සොරොව්වකට, වැව්තාවුල්ලකට, ඇළකට, දොළකට, දිය පාරකට, ජල රක්ෂිතයකට, වාරි රක්ෂිතයකට, කෘෂි මාර්ගයකට, කඳුරකට, ගංගාවකට, අමුණකට, වාරි ඉදිකිරීමකට හෝ වාරි කර්මාන්ත සම්බන්ධ එල්ලංගා පද්ධතියකට කුමන ආකාරයකින්: වාරි රක්ෂිතයට කර්මාන්තවලට අලාභහානි කිරීම වරදක්.

(i) අවහිර කරනු ලැබීම,
(ii) බාධා කරනු ලැබීම,
(iii) අයත් භූමිය අනවසරයෙන් කොටුකර ගනු ලැබීම,
(iv) බාධා කිරීමට කොටුකර ගැනීමට කටයුතු සැලැස්වීම,
(v) අලාභ හානි කිරීමට හෝ කරවීමට කටයුතු කිරීම,
(vi) අයත් ජලය ඕනෑකමින් හෝ ද්වේශ සහගතව අපතේ හැරීමට කටයුතු කිරීම,
(vii) වාරිමාර්ගයක් තුළ හෝ වාරිමාර්ග රක්ෂිතයක් තුළ ගොවිතැන් කිරීම හෝ වෙනත් නිර්මිතයක් ඉදිකිරීම,
(viii) අදාල ප්‍රදේශයකින් අනවසරයෙන් පස් හෝ වැලි ඉවත් කිරීම හා/ හෝ ඉවත් කිරීමට සැලැස්වීම,
(ix) අදාල ප්‍රදේශයකට කුඹුරු වගාවක් නොවන වෙනත් කටයුත්තක් සඳහා අනවසරයෙන් පස්, වැලි, බොරළු, ගල් හෝ එවැනි දේ පිටතින් ගෙනැවිත් දැමීම,
(x) අපද්‍රව්‍ය මුදාහැරීමට සැලැස්වීම හෝ යාමට ඉඩහැරීම හෝ පිටතින් ගෙනවිත් දැමීම,
(xi) සතුන්, වාහන හෝ යන්ත්‍ර සූත්‍ර මගින් හානි සිදුකිරීමට සැලැස්වීම,
(xii) ඉහත කරුණු සඳහා ආධාර අනුබල ලබාදීම,

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

2. හඳුනාගත් නිශ්චිත වාරි පද්ධතියක් තුළ පළාත් අධ්‍යක්ෂ විසින් නියමකරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස ගොවිතැන් කටයුතු කිරීම සඳහා වගා ළිඳක් කැපීම, ඉදිකිරීම හෝ පවත්වාගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

3. වාරි කමිටුව හා/ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලය වගා කටයුතු සම්බන්ධ රැස්වීම්වලදී ගන්නා ලද තීරණවලට පටහැනිව කටයුතු කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

20. යම් තැනැත්තකු 19 වෙනි වගන්තිය යටතේ ඇති විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට පළාත් අධ්‍යක්ෂවරයාට පෙනී යන අවස්ථාවේ දී, පළාත් අධ්‍යක්ෂවරයා විසින් නියෝග නිකුත් කිරීම.

(i) අදාල වරද වහාම යථාවත් කරන ලෙස,
(ii) තවදුරටත් කරගෙන යාමෙන් වළකින ලෙස,
(iii) දින 7ක අවම හා දින 14ක උපරිම කාල සීමාවක අදල කාර්ය යථා තත්ත්වයට පත්කරන ලෙසට නියම කරමින් 01 වන උපලේඛනයට සාරානුකූලව නියෝගයක් වහාම පළාත් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

නියෝග පිළිනොපදින විට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.

21. (i) කිසියම් තැනැත්තකු ඉහත 20 වන වගන්තියේ නියෝගයට අනුකූලව කටයුතු කරනු නොලබන අවස්ථා වලදී ලිඛිත දැන්වීමක් මගින් ඒ බව නිසි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දීමේ බලය පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ බලය පවරන ලද නියෝජිතයා සතු වන්නේය.

(ii) 21-i උපවගන්තිය යටතේ ලිඛිත දැන්වීමක් මහේස්ත්‍රාත්වරයා වෙත ලද විට මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එම තැනැත්තා වරදකරු කළ විට, රුපියල් දස දහස නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ, එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකම නියම කිරීමට අමතරව අදාල කාර්යය කිරීම හෝ නොසළකා හැරීම තුළින් වන කටයුත්ත යථාවත් කිරීමට යන වියදම ද වරද කරන තැනැත්තා විසින් හෝ තැනැත්තන් විසින් තනිතනිව හෝ සාමූහිකව අයකරගත යුතුය. එවැනි වියදමක් පිළිබඳව අධ්‍යක්ෂවරයා විසින් ලබාදෙන වාර්ථාව එම නීති කෘතියේ තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

(iii) අධ්‍යක්ෂවරයා විසින් 20 වෙනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන නියෝගය ක්‍රියාත්මක කරන ලෙසට වරදකරු වෙත නියෝග කිරීමේ බලය මහේස්ත්‍රාත් අධිකරණය සතු වන්නේය.

සාමාන්‍ය දණ්ඩන.

22. මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් රෙගුලාසියක විධිවිධාන උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එකී වරද මෙම ප්‍රඥප්තිය මගින් විශේෂයෙන් දණ්ඩනයක් සලසනු නොලැබ ඇති වරදක් වන අවස්ථාවකදී මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එම තැනැත්තා වරදකරු කළ විට, රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය හෝ බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත්විය යුතුය.

## vi වන කොටස

## පොදු විධිවිධාන

ප්‍රඥප්තියට අදාළ රෙගුලාසි පැනවීම.

23. මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍යවන්නා වූ කරුණු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය හා බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි පැනවීමේ බලය අමාත්‍යවරයා සතුය.

24. (i) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමේ දින සිට හෝ ඒ රෙගුලාසියේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු මසක් ඇතුළත හෝ හැකි ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් රෙගුලාසියක් එකී අනනුමත දිනයේ සිට එකී රෙගුලාසි යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර එය ගැසට් පත්‍රයේ පළකළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරන ලද සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(iii) මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රෙගුලාසි පළාත් සභාවේ සම්මත වීමෙන් පසුව ඒවා මෙම ප්‍රඥප්තිය මගින් පැනවුවක් මෙන් බලාත්මක විය යුතුය.

(iv) රජයේ යම් දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, තැනැත්තකු හෝ පුද්ගලික මණ්ඩලයක් මගින් ඉහත අංක 7(v) යටතේ ගැසට් පත්‍රයේ පළකල කුමන ආකාරයේ හෝ වාරි ක්‍රමයකට අයත්වන වාරි කර්මාන්තයක් පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ සංරක්ෂණය කිරීමට අදහස්කරනු ලබන්නේ නම් ඒ සඳහා පළාත් අධ්‍යක්ෂගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

vii වන කොටස

**පොදු විධිවිධාන**

25. නියමිත දිනට පෙරාතුව සිට පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබ ඇති පුද්ගලයා සහ අනෙකුත් තනතුරු සඳහා පත්කරනු ලැබ ඇති නිලධාරීන් මෙම ප්‍රඥප්තියේ නියමයන්ට සහ කොන්දේසින්වලට වඩා වාසිදායක භාවයෙන් අඩු නොවන්නා වූ නියම හා කොන්දේසිවලට යටත්ව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවා නියුක්තිකයන් ලෙස සළකනු ලැබිය යුත්තේ ය. පෙරතුව සිට ධුරය දරන පළාත් අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය.

26. (i) නියමිත දිනට පෙරාතුව සිට ක්‍රියාත්මක වූ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව පැවති සියලු වත්කම්. වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු සහ එම දෙපාර්තමේන්තුව සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම් සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව යටතේ පවතින වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු හා ගිවිසුම් ලෙස සළකනු ලැබිය යුතු ය. වත්කම් වගකීම් හා බැඳීම් ඉදිරියට පවත්වාගෙන යාම.

(ii) නියමිත දිනට පෙරාතුව සිට ක්‍රියාත්මක වූ මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල තුන සතුව පැවැති සියළුම වත්කම්, වගකීම්, සියළු ණය බැඳීම්, නඩු කටයුතු සහ දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරුන් සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම් සියල්ල මෙම ප්‍රඥපත්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව යටතේ පවතින වත්කම්, වගකීම්, සියළු ණය බැඳීම්, නඩු කටයුතු සහ ගිවිසුම් ලෙස සළකනු ලැබිය යුතුය.

viii වන කොටස

**අර්ථ නිරූපණ**

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස; අර්ථ නිරූපණ.

"වාරිමාර්ග වැඩ" යන්නෙන්, පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර පළාත තුළ පිහිටි කෘෂිකාර්මික ඉඩමකට ජලය සපයන වාරි කර්මාන්තයක් අදහස් වේ.

"සුළු වාරිමාර්ග වැඩ" යන්නෙන්, අක්කර දෙසීය (200) දක්වා වූ කෘෂිකාර්මික ඉඩමකට ජලය සපයන වාරි කර්මාන්තයක් අදහස් වේ.

"පළාත" යන්නෙන්, මධ්‍යම පළාත අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, මධ්‍යම පළාත් සභාව අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස තත්කාලයේ ධූරය දරන තැනැත්තා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, මධ්‍යම පළාත් සභාවේ වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන්, මධ්‍යම පළාත් සභාවේ වාරිමාර්ග විෂය පවරා ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"පළාත් අධ්‍යක්ෂ" යන්නෙන්, මධ්‍යම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා අදහස් වේ.

"ඉංජිනේරු" යන්නෙන්, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම වෙනුවෙන් පත්කෙරෙන ඉංජිනේරුවරුන් අදහස් වේ.

"ඉදිකිරීම්" යන්නෙන්, යම් වාරි කර්මාන්තයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, යම් වාරි කර්මාන්තයකට කරන ලද යම් වැඩි දියුණු කිරීමක් හෝ ව්‍යාප්තියක් හෝ අතහැර දමන ලද යම් වාරි කර්මාන්තයක් අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ (මෙහි මින් මතු දක්වනු ලබන "නඩත්තු කිරීම") යම් වාරි කර්මාන්තයක් ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන යම් ක්‍රියා මාර්ගයක් හෝ ඒ යටතට පත්වන ජලය සැපයිය හැකි ප්‍රදේශ හෝ එවැනි කර්මාන්තයක නැතහොත් ප්‍රදේශයක යම් කොටසක් අදහස් වේ.

"නඩත්තු කිරීම" යන්නෙන්, යම් වාරි කර්මාන්තයක් සම්බන්ධයෙන් යෙදී ඇතිවිට එවකට පවත්නා යම් වාරි කර්මාන්තයක් හෝ ඒ යටතේ ජලය සපයනු ලැබිය හැකි ප්‍රදේශ හෝ ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩව කළ යුතු අළුත්වැඩියාවන් අදහස් වේ.

"වාරි කර්මාන්ත" යන්නෙන්, පළාත් වාරිමාර්ග විෂයට අයත් වන්නා වූ:–

(i) වාරි කර්මාන්තයක් සංයුක්ත වන හෝ ඊට අනුෂාංගික වන හෝ අනුයාත වන යම් වැවක්, එල්ලාංග පද්ධතියක්, වේල්ලක්, අමුණක්, ඇළක්, ඇළ මාර්ග පද්ධතියක්, කුඹුරු අතු වේල්ලක් හෝ ජල මාර්ගයක් හෝ;

(ii) වාරි කර්මාන්තයක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම සංයුක්ත වන හෝ ඊට අනුෂාංගික වන හෝ අනුයාත වන යම් ව්‍යුහයක්, පාරක්, පාලමක්, සොරොව්වක්, දොරටුවක් හෝ වෙනත් ඉංජිනේරු කර්මාන්තයක් හෝ;

(iii) වගාකල යම් ප්‍රදේශයක පිහිටි ගොවිතැන් කල යම් ප්‍රදේශයක් ජල ගැලීම්වලින් හෝ වෙනත් ආපදාවකින් ආරක්ෂා කිරීම සඳහා ඉදි කරන ලද යම් ව්‍යුහයක්, වේල්ලක්, සොරොව්වක් හෝ වෙනත් ඉංජිනේරු කර්මාන්තයක් හෝ අදහස් වේ;

"ජල මාර්ගය" යන්නෙන්, යම් ගඟක්, අතු ගංගාවක් හෝ ඔයක් හෝ ඇළක් හෝ ස්වභාවික ඇළක් හෝ කලින් කල ජලය ගලාගෙන යාම සඳහා පිළියෙල කරන ලද ඇළක් හෝ ජලය ගලාගෙන යන අතුගංගාවක් හෝ ජල මාර්ගයක් හෝ එවැනි අතු ගංගාවක අත්තක් හෝ අදහස් වන අතර, එකී යම් ජල මාර්ගයක මධ්‍යයේ සිට එහි ඉවුර දක්වා ඇති පළල ප්‍රමාණයට සමාන පළලට ඒ ඉවුරු දෙපසේම සිට ගොඩ දෙසට විහිදෙන ප්‍රදේශය ඊට අයත් වේ.

"කුඹුරු ඉඩම්" යන්නෙන්, වී වගාකොට ඇත්තා වූ සහ වී වගා කිරීමට පිළියෙළ කර ඇත්තා වූ යම් පෙර කාලයකදී වී වගා කොට තිබුණා වූ සහ වී වගා කිරීමට යෝග්‍ය වන්නා වූ ඉඩමක් අදහස් වන අතර ඒ ඉඩමට යාබදව නැතහොත් ඒ ඉඩමට අනුබද්ධිතව පිහිටියා වූ ද කමතක් වශයෙන් හෝ පදිංචිය සඳහා නිවාසයක් ඉදිකිරීම සඳහා හෝ ගොවියා විසින් භාවිතා කරන ලබන්නා වූ ද ඉඩමක් එයට ඇතුළත් වේ. ගොවිතැන් කටයුතු නොවන වෙනත් කටයුතු සඳහා භාවිතා කරනු ලබන හෝ කුඹුරු ඉඩමක් නොවන බවට ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද ඉඩමක් එයට ඇතුළත් නොවේ.

"බුක්තිකරු" යන්නෙන්, බදු ගැනුම්කරුවෙකු හෝ පොළිමරා බුක්තිකරුවෙකු හෝ වීම හේතුකොට ගෙන කෘෂිකාර්මික ඉඩමක් පාවිච්චි කිරීමට හෝ එහි බුක්තිය දැරීමට හෝ තත්කාලයේ හිමිකම ඇත්තා වූ තැනැත්තකු අදහස් වන අතර ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ නියාදනය යටතේ කරන ලද කෘෂිකාර්මික ඉඩම් පාවිච්චි කරන, බුක්ති විඳින තැනැත්තන් ද, අඳ ගොවියෙකු ද ඇතුළත් වේ.

"එල්ලංගාව හෝ වාරි පද්ධතිය" යන්නෙන්, යම් නිශ්චිත බෑවුම් සහිත ප්‍රදේශයකින් ආරම්භව එක් දිශාවකට ගලා බස්නා ජල ප්‍රවාහයන් ඒකරාශි වී එකී එක් එක් වාරි මාර්ගවලට වඩා වර්ෂාව ලැබීමේ හේතුවෙන් පිටාර යමින් ජලය එකතු වෙමින් ගලා ගොස් අවසාන වශයෙන් ගංගාවකට ඔයකට සම්බන්ධවීමට ප්‍රථම ජලය එකතුවන වැවක් ද සහිතව පිහිටා ඇති සියළුම වාරිමාර්ග ද සහිත වන්නා වූ පෝෂිත ප්‍රදේශ, රක්ෂිත ඇළ දොළ කුඹුරු ද සහිත වූ වාරිමාර්ග කිහිපයකින් හෝ රාශියකින් සමන්විත ප්‍රදේශයන් අදහස් වේ.

"පාරිශ්‍රමිකය" යන්නෙන්, වාරි නියෝජිතයා තමන්ගේ අයිති කුඹුර/කුඹුරු හෝ බුක්තිකරු වශයෙන් වගා කෙරෙන කුඹුර/කුඹුරු හෝ වගා කිරීමේදී ක්‍රමසම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ දී දරන්නා වූ වගකීමට අමතරව එකී කුඹුරු යායන් සහිත වාරිමාර්ගයන් නිසිලෙස පවත්වාගෙන යමින්, ක්‍රමවත්ව, වගා කන්නයන් මෙහෙයවීම වෙනුවෙන් සෙසු ගොවීන්ට වඩා දරන්නා වූ වෙහෙස හා වගකීම වෙනුවෙන් සෙසු ගොවීන් විසින් ඔවුන්ගේ මනාපයෙන් ලබා ගන්නා වූ අස්වැන්නෙන් ලබාදෙන කොටස අදහස් වේ.

"පංගුව" යන්නෙන්, යම් කිසි වාරි කර්මාන්තයක හෝ ජලය ලබාගෙන ගොවිතැන් කෙරෙන යායක කුඹුරු නාම ලේඛනයට ඇතුළත් වී ඇති ගොවීන්ගේ සංඛ්‍යාව සහ කුඹුරු ඉඩම් ප්‍රමාණය ගණනය කොට ඊට අනුපාතිකව වැව් බැම්ම, වාන් ඇළ බෙදා වෙන් කළ පසුව ප්‍රධාන වේල්ලේ හෝ ප්‍රධාන ඇළ මාර්ගයේ ප්‍රමාණය කුඹුරු ඉඩම්වලට අනුපාතිකව හිමිවන කොටස කොටස අදහස් වේ.

"වාරි රක්ෂිතය" යන්නෙන්, වැවක් අමුණක් වාරි මාර්ගයක් හෝ පිට ඇළ මාර්ගයක් ආරක්ෂා කිරීමට රැක ගැනීමට හා ඉදිරි නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නිර්බාධිතව තබනු ලබන බිම්කඩ වේ.

එනම්:

| | | |
|---|---|---|
| වැවක හෝ අමුණක | – | උපරිම ජල මට්ටමේ සිට මීටර 10 ක් ද, |
| වාරි ඇළ මාර්ගවල | – | ඇළ පතුල පළල මීටර 03 ක් හෝ ඊට අඩුනම් ඇළ ඉවුරේ උපරිම ජල සීමාවේ සිට මීටර 05 ක් ද, ඇළ පතුල මීටර 03 ක් හෝ ඊට වැඩි නම් ඇළ ඉවුරේ උපරිම ජල සීමාවේ සිට මීටර 10 ක් ද, |

"වාරි රක්ෂිතය" වේ.

28. මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලාත්මක වන්නේය.

උපලේඛනය 01

**A** ආකෘතිය

මධ්‍යම පළාත් සභාවේ 2017 අංක 05 දරන වාරිමාර්ග ප්‍රඥප්තියේ (..................) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව .......................... වාරිමාර්ග අධ්‍යක්ෂ වන මම .......................... වන ඔබ මෙහි පහත විස්තර කරනු ලබන වරද සිදුකර ඇති සහ/හෝ සිදුකිරීමට අත්‍යාසන්න බවට මාගේ මතය වන හෙයින්,

පරිදි කටයුතු වහාම කරන ලෙසට සහ/හෝ,

පරිදි කටයුතු කිරීමෙන්/තවදුරටත් කරගෙන යාමෙන් වැළකෙන ලෙස සහ/හෝ,

පරිදි .......................... කාලය තුළ/ඔබ විසින් ඉටු කර ඇති ක්‍රියාව යථා තත්ත්වයට පත් කරන ලෙස මෙයින් ඔබට නියෝග කරමි.

ඉහත නියෝගය ප්‍රකාරව කටයුතු කිරීමට ඔබ අපොහොසත් වන්නේ නම් වාරිමාර්ග ප්‍රඥප්තියේ 20 වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ඔබට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නා බව දන්වමි.

පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, දිනය: ........................
මධ්‍යම පළාත.

08 – 949

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.